## ශ්‍රී පාලි මණ්ඩපය
# කොළඹ විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2021 පෙබරවාරි 18 වැනි දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

### ස්ථිර තනතුරු

### පරිගණක අධ්‍යයනාංශය

**01. කථිකාචාර්ය (ආධුනික), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I ශ්‍රේණිය)**

**සුදුසුකම් :** තොරතුරු තාක්‍ෂණය හෝ පරිගණක (Information Technology or Computing) යන විෂයයෙන් ගෞරව උපාධිය හදාරා තිබීම.

**02. උපදේශක (පරිගණක තාක්‍ෂණ) II ශ්‍රේණිය**

**සුදුසුකම් :** පරිගණක විද්‍යා / පරිගණක ඉංජිනේරු (Computer Science / Computer Engineering) යන විෂයයෙන් ගෞරව උපාධිය හදාරා තිබීම.

### ප්‍රසංගකලා අධ්‍යයනාංශය

**01. කථිකාචාර්ය (ආධුනික), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I ශ්‍රේණිය)**

**සුදුසුකම් :** පහත සඳහන් ක්‍ෂේත්‍රයන්ගෙන් ශාස්ත්‍රවේදී කලා / ප්‍රසංග කලා / ලලිත කලා ගෞරව උපාධිය හදාරා තිබීම.

**ක්‍ෂේත්‍රය :**
- සිනමා අධ්‍යයනය
- චිත්‍ර හා සැලසුම්කරණය

ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ට අදාළ ආදර්ශ අයදුම්පත හා විස්තර පත්‍රිකා නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, වැවල, හොරණ වෙතින් හෝ ශ්‍රී පාලි මණ්ඩපයේ වෙබ් අඩවියෙන් (https://spc.cmb.ac.lk) බාගත (Download) කළ හැකිය. ශ්‍රී පාලි මණ්ඩපයේ වෙබ් අඩවියේ ඇති උක්ත පුරප්පාඩු සම්බන්ධ විස්තර පත්‍රිකා අධ්‍යයනය කරන මෙන් අදාළ අයදුම්කරුවන්ට තවදුරටත් උපදෙස් දෙනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත, අදාළ අධ්‍යාපන සුදුසුකම් (විස්තරාත්මක උපාධි සහතික සමග) හා වෘත්තීය හා සේවා සහතික හා වෙනත් සුදුසුකම්වලට අදාළ සහතික පිටපත් සමග නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ යන ලිපිනයට 2022 පෙබරවාරි 18 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා හා අනෙකුත් ආයතනවල අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානියා මගින් එවනු ලබන අයදුම්පතෙහි අමතර පිටපතක් දී ඇති ලිපිනයට එවීමට කටයුතු කරන්න.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ඇගයීමට භාජනය නොවනු ඇත. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය,**
**ලේඛකාධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවට.**

2022.01.28

Source: Dinamina, Daily News (2022.01.31)